**ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම - 2023**
**------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 අඛණ්ඩ පැවැත්මට අදාළ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාව

මාගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව, මූල්‍ය ප්‍රකාශණවල සටහන් 2.1 වෙත අවධානය යොමු කරවමි.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.5 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල රුපියල් මිලියන 0.16 වන රඳවා ගැනීමේ බදු ප්‍රමාණයක් හඳුනාගෙන නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ආදායම සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ එම ප්‍රමාණයන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණකගේ නිරීක්ෂණ සමඟ එකඟ වන අතර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | රු. මිලියන 5.2 | ස්ථාවර වත්කම් සත්‍යාපන වාර්තාව | මෙම සියලු වත්කම්වල ලියාහල අගය ශූන්‍ය වන අතර ඒවා ගබඩා කිරීම සඳහා වස්කඩුව මධ්‍යම ගබඩා වෙත යවා ඇත. | වත්කම් වල භෞතික පැවැත්ම තහවුරු කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 9.47 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂයක් පැවැති අතර එම ශේෂයෙන් රුපියල් මිලියන 9.41 ක් වසර 5 කට වැඩි කාලයක සිට ලැබිය යුතුව පවතුණි. ණයගැති ශේෂයන් අයකර ගැනීමට සමාගම ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය. එසේ වුවද, වසර පහකට වැඩි රුපියල් මිලියන 9.35 ක ණයගැති ශේෂ සඳහා හානිකරන අලාභයක් හඳුනාගෙන තිබුණි. | විගණකගේ නිරීක්ෂණ සමඟ එකඟ වන අතර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වෙළඳ සහ අනෙකුත් **ලැබිය** යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| සාංගමික ව්‍යවස්ථාවලියේ 52 වගන්තිය | සමාගම විසින් මහා සභා රැස්වීමක් සෑම වර්ෂයකම ශේෂ පත්‍ර දිනයෙන් පසු මාස හයකට නොඅඩු කාලයක් තුල පැවැත්විය යුතුය . කෙසේ වෙතත්, සමාගම පසුගිය වසරවලදී වාර්ෂික මහා සභා රැස්වීමක් පවත්වා නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමග එකඟ වේ, 2024 වසරේ සිට වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | සාංගමික ව්‍යවස්ථාවලියේ 52 වගන්තිය අනුව වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 2.01 ක පාඩුවක් වූ අතර එයට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රුපියල් මිලියන 7.47 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් මිලියන 9.49ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධානම හේතුව වන්නේ සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් නොතිබීම, පරිපාලන වියදම් වැඩිවීම, මූල්‍ය ආදායම අඩුවීම සහ අහිතකර ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ද්‍රව්‍ය පිරිවැය ඉහළ ගොස් තිබීම වේ.

### 2.2 අනුපාත විශ්ලේෂණය

(අ) සමාගමේ ජංගම වත්කම් අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 1.25 සිට 1.20 දක්වා පිරිහී ඇත.

(ආ) සමාගමේ දළ ලාභ / (අලාභ) අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 14.53% සිට (70%) දක්වා පිරිහී ඇත.

(ඇ) සමාගමේ ශුද්ධ ලාභ / (අලාභ) අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 26.3% සිට (32.6%) දක්වා පිරිහී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදුලි කණු නිෂ්පාදනය ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමේ එක් ප්‍රධාන ව්‍යාපාරයක් විය. තත්ව පරීක්ෂාව අසමත් වීම හේතුවෙන් 2013 වර්ෂයේදී විදුලිකණු නිෂ්පාදනය නවතා දමා ඇත. ඉන් පසු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම විදුලිකණුවල ගුණාත්වය ඉහල නංවමින් නැවත විදුලිකණු නිෂ්පාදනය ඇරඹීම හෝ වෙනත් සුදුසු ව්‍යාපාරයක් හඳුනා ගැනීම හෝ සිදු කර නොමැත.<br>තවදුරටත්, 2023 දෙසැම්බර් 31 දිනට සමාගම රුපියල් මිලියන 20.5 ක සමුච්චිත අලාභයක් වාර්ථාකර ඇත. | විදුලි කණු ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රාග්ධන කොටස රු.25,000,000 වන අතර සමුච්චිත පාඩුව ද වාර්තා කර ඇත. තවද,අවශ්‍ය ක්‍රියාමාර්ග ඉක්මනින් ගනු ලැබේ. | ගුණත්වය ඉහල දමමින් විදුලි කණු නිෂ්පාදනය නැවත ආරම්භ කිරීමට හෝ වෙනත් සුදුසු ව්‍යාපාරයක් හඳුනාගැනීමට ක්‍රියා කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය රුපියල් මිලියන 5.2 ක් වූ අතර මෙම වත්කම් සියල්ල 2013 වසරේ සිට නිෂ්ක්‍රියව පවතී. | මෙම සියලු වත්කම්වල ලියාහල අගය ශුන්‍ය වන අතර ඒවා ගබඩා කිරීම සඳහා වස්කඩුව මධ්‍යම ගබඩා වෙත යවා ඇත. | ආයතනයේ සම්පත් වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි පරිදි ප්‍රයෝජනයට යුතු වේ. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |